# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.02.24 |

## ශ්‍රී ලංකා මහ බැංකුව සිය 70 වන සංවත්සරය නිමිත්තෙන් සංසරණය සඳහා භාවිතා කරනු ලබන සමරු කාසියක් නිකුත් කරයි.

1950 අගෝස්තු මාසයේ දී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ සමෘද්ධිය උදෙසා සුවිශේෂී හා වටිනා දායකත්වයක් ලබා දෙමින් වසර 70 ක් සම්පූර්ණ කර ඇත. සිය 70 වන සංවත්සරය සංකේතවත් කරමින් මුහුණත වටිනාකම රුපියල් 20 ක් වන සංසරණය සඳහා නොවන සමරු කාසියක් (ඇලුමිනියම් - ලෝකඩ) 2020 දෙසැම්බර් 31 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. එයට සමගාමීව, සමාන නිර්මාණ සැලැස්මක් සහිත මුහුණත වටිනාකම රුපියල් 20 ක් වන සංසරණය සඳහා භාවිතා කරනු ලබන සමරු කාසියක් (නිකල් ආලේපිත වානේ) නිකුත් කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත. කාසිය පිළිබඳ විස්තර හා පිරිවිතර පහතින් සවිස්තරව දැක්වේ.

| කාසියේ මුහුණත | කාසියේ පිටුපස |
|---|---|
|   |   |
| කාසියේ මුහුණතෙහි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ල පිළිබිඹු කරන අතර “70” යන්න විශාල ඉලක්කමින් කාසිය මධ්‍යයේ දැක්වේ. කාසියේ ඉහළ පරිධියේ දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් “ශ්‍රී ලංකා මහ බැංකුව” ලෙස දැක්වේ. 1950-2020 වර්ෂයන් කාසියේ දාරයේ දක්වා ඇත. | කාසියේ මුහුණත වටිනාකම “20” විශාල ඉලක්කමින් සහ “රුපියල් විස්සයි” යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින්ද “2020” වර්ෂය එම වචන වලට පහළින් ද කාසියේ පිටුපස දැක්වේ. කාසිය පරිධියේ ඉහළ දාරයේ දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් “ශ්‍රී ලංකා” ලෙස දැක්වේ. |

**කාසිය පිළිබඳ විස්තර**

| | | | |
|---|---|---|---|
| **කාසියේ සඳහන් වර්ෂය** | 2020 | **ටංකනය කළ කාසි ගණන** | 5,000,000 |
| **ලෝහය** | නිකල් ආලේපිත | **හැඩය** | පැති 7 ක් සහිත |

| | | | |
|---|---|---|---|
| | වානේ | | |
| **කාසි වර්ගය** | සාමාන්‍ය සංසරණය | **දාරය** | පැතලි |
| **විෂ්කම්භය** | මි.මී. 28 | **ඝනකම** | මි.මී. 2 |

මෙහි පළමු සමරු කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මහචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා විසින් ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත 2021.02.24 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී නිල වශයෙන් පිළිගන්වන ලදී.



මෙම කාසිය බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා 2021 මාර්තු 03 වැනි දින සිට සංසරණයට නිකුත් කරනු ලබන අතර දැනට සංසරණයේ පවත්නා අනෙකුත් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සමඟ ගෙවීම් සඳහා භාවිතා කළ හැකිය.

| වැඩි විස්තර සඳහා: | දුරකථක අංකය | ෆැක්ස් අංකය |
|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරී | +94 11 247 7587 | +94 11 247 7726 |
| අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී | +94 11 247 7152 | +94 11 247 7701 |
| විද්‍යුත් ලිපිනය | currency@cbsl.lk | |

ව්‍යවහාර මුදල් අධිකාරී
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 1